

# සිනුවර හසුන

*සිඩ්නි සිට ලියමි*

සිඩ්නි නුවර ඕස්ට්‍රේලියාවේ පැරණිම නගරය මෙන්ම, ප්‍රමාණයෙන් විශාලතම, වැඩිම ජනගහනයක් වෙසෙන සහ වඩාත්ම වියදම්කාරී නගරය ද වේ. දැනට සාර්ථක හත්වෙනි වසරේ සිඩ්නි තදාසන්නයේ වාසය කරන මට, මේ සුවිසල් නගරය හා ඇති එක ප්‍රශ්ණයක් නම් සිඩ්නි යන නාමය කවි පදයක යෙදිය හැකි ආකාරයේ මටසිළුටු එකක් නොවීමයි. එලිවැට සඳහා සිඩ්නි නාමය යොදා ගැනීම නම් හුදෙක් සිහිනයක් ම පමණි. මේ ප්‍රශ්ණයට සාර්ථක විසඳුමක් ලබා දුන්නේ ඕස්ට්‍රේලියාවේ සිට ශ්‍රී ලංකාවට සමනලයෙකු මගින් යැවෙන සංදේශ කාව්‍යයක් "සමනල දූතය" නමින් රචනා කළ සිඩ්නි වාසී හෙන්රි කුමාරප්පෙරුම කවියා ය. ඔහු සිඩ්නි නුවර සිනුවර නමින් සිය පද්‍ය නිර්මාණයන් හි දී හඳුන්වයි. මගේ මේ ගද්‍ය තීරු ලිපිය සඳහා ද ඒ නම යොදා ගැනීමට මම අදහස් කරමි.

මෙල්බර්න් හා සසඳන විට සිනුවර සිටින්නේ තරමක් ප්‍රමාණාත්මකව අඩු සිංහල ජන කොටසකි. ලංකාවේ සිට ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය කරන අති මහත් බහුතර ජනතාව අනිවාර්‍ය්‍යයෙන් ම පැමිණෙන්නේ කවුරුන් හෝ තමන් දන්නා අඳුනන කෙනෙක් සිටින නගරයට නිසා දිගින් දිගටම මේ ජනගහන පරතරය වැඩි වෙයි. මේ න්‍යාය අනුගමනය නොකළ අය මා දන්නේ දෙදෙනෙකු පමණි. මින් පළමුවැන්නා ලංකාවේ දී අඩුම සංක්‍රමණිකයින් ප්‍රමාණයක් පැමිණෙන නගරය සොයා බලා හෝබාර්ට් නගරයට සංක්‍රමණය කළේ එම ආර්ථික අවගමන සමයේ රැකියාවක් සොයා ගැනීම පහසු වෙතැයි සිතාය. වසර කිහිපයකට පසුව ඔහු ආපසු ලංකාවට ගියේය. දෙවැන්නා සංක්‍රමණිකයින් ට සති හතරක් නොමිලයේ නිවාස සහ වෙනත් පහසුකම් දෙන බව අසා ඇඩිලේඩ් නුවරට සම්ප්‍රාප්ත විය. ඔහු දැන් සිය පවුල ද සමග සිනුවර වසයි.

මෙල්බර්න් නුවර සිංහල ජනගහනය වැඩිවීමත් සමගම, එය ක්‍රම ක්‍රමයෙන් ඕස්ට්‍රේලියානු සිංහල සංස්කෘතියේ කේන්ද්‍රස්ථානය බවට පත්වෙනු පසුගිය වසර හත තුල දී මම දුටුවෙමි. සන්නස වැනි මාසික පුවත් සඟරා මෙල්බර්න් හි ප්‍රකාශනය වේ. සිනමා සිත්තම්, වේදිකා නාට්‍ය, නර්තන, රංගන ප්‍රසංග මෙල්බර්න් හි නිපදවේ. අද සිංහල සිනමා සිත්තමක් සිනුවර එක් දර්ශනයක් පැවැත්වෙන විට, එය මෙල්බර්න් හි තුන් හතර වරක් දර්ශනය කිරීම සාමාන්‍ය සිදුවීමකි.

කරුණු එසේ වූවද, සිනුවර වසන අප සිටින්නේ ද වැඩි පසුපසින් නොවේ. මෙහි ප්‍රමුඛ සිංහල සංස්කෘතික සංවිධානය වන සිංහල සංස්කෘතික හමුව පිහිටුවා දැන් වසර දහ අටකි. ඔවුන් ප්‍රකාශනය කරන ත්‍රෛමාසික සිංහල සාහිත්‍ය සඟරාවට දැන් වසර අටක් පිරී ඇත. මීට අමතරව සිනුවර ද සිනමා සිත්තම්, නාට්‍ය සහ නර්තන රංගන යනාදිය නිපදවේ.

ගතවූ අගෝස්තු මාසය සිනුවර සිහල රසික ජනතාවට ඉතා අගනා කාලයක් විය. මුලින් ම ශ්‍රී ලංකාවේ සිට පැමිණි අග්‍රගන්‍ය සංගීතඥයින් සහ ගායකයින් පස් දෙනෙක්, සිඩ්නි සංගීතවේදීන් කිහිප දෙනෙකු හා එක්ව ඉදිරිපත් කළ තුන් සිතක රාවය සංගීත ප්‍රසංගය රස විඳීමට අපට හැකිවිය. ඉන් සතියක් ගතවුනු තැන, සිනුවර වෙසන නාට්‍යකරු චම්පා බුද්ධිපාල ගේ දැවැන්ත නිර්මාණයක් වූ දස්කොන් වේදිකා නාට්‍යය ශ්‍රී ලංකාවේ සිට පැමිණි නළු නිලියන් ගේ ද, සිනුවර නළු නිලියන් සහ නර්තන ශිල්පීන්ගේ ද දායකත්වයෙන් අප හද, මන පුබුදුවාලීය. අගෝස්තු මාසය අවසානයට යෙදී තිබුනේ සිනුවර සංගීතඥයින්, ගායක ගායිකාවන් එකට එක් කළ "දිය දෝතක්" පැදුරු සාජ්ජයයි.

දේශගුණික සිසිරය නිමා වීමටත් පෙර, නිකිණි මහේ දී ම, රසික වසන්තය සිනුවරට ලැබුවා සේ විය.

සිනුවර රස තොරතුරු රැගත් "සිනුවර හසුන" සමග ලබන මාසයේ නැවත හමුවෙමු.


සිනුවර ආරච්චිල

<sinuwara.arachchila@gmail.com>



# කස්තිරම

## ඩී බී කුරුප්පු



# සිසිරගේ මෙල්බර්න් සිසිර සැඳෑ මිහිර

ශ්‍රී ලංකාවේ කාර්යාල වල ලොකු නිලධාරීන්ගේ මේසය මත වීදුරු තහඩුවකින් වසා ඇති මූණතේ වීදුරුවට යටින් ආගන්තුකයාගේ නෙත ගැටෙන ආකාරයට තබා තිබුණු පඬි වදනක් මට මතක් වෙයි. එහි සිංහල අර්ථය මෙසේ දැක්විය හැකි ය.

"ශ්‍රේෂ්ටයෝ අදහස් සාකච්ඡා කරන්නෝය. මධ්‍යම මට්ටමේ උදවිය සිදුවීම් ගැන කතා කරන්නෝ ය. සාමාන්‍ය මිනිස්සු පුද්ගලයන් ගැන දොඩන්නෝ ය"

සිසිර දිසානායක ගේ "නුඹෙ සිරික්කියට" දොරට වැඩීමේ උළෙල ගැන කියන්නට මට ඒ කියමන සිහිපත් වන්නේ ගීත රචනය හෝ ගායනය ගැන යමක් කියන්නට හැකියාවක් මට නැති නිසා ය. මට සිද්ද වන්නේ යට කී දෙවැනි කැලෑසියේ ගෑවී නොගෑවී තුන්වැනි කැලෑසියේ මිනිසුන් කරන දේම කරන්නට ය. පුද්ගලයන් ගැන නොව - එක් පුද්ගලයකු - එනම් සිසිර දිසානායක ගැන කියන්නට ය.

සිසිරත් මාත් අතර සමානකමක් සොයන්නට තැත් කරන මම අප දෙනොම ආනන්ද විද්‍යාලයට සම්බන්ධ වූ බව කිව හැකි ය. එහෙත් ඒ දෙවිදිහකට ය. සිසිර විදුහලේ උගත්තෙකි. මම එහි ඉගැන්නූ ගුරුවරයෙක්මි. ඊටත් වඩා අප දෙදෙනා වැටෙන්නේ යුග දෙකකටය. මම මෙත්තානන්ද - විජයතිලක යුගයට අයත් වෙමි. මා ආනන්දයෙන් අස් වූවාට පසුව උගත් සිසිර අයත් වන්නේ පේරුසිංහ - රාජපක්ෂ යුගයට යයි සිතමි.

සිසිරත්, මමත් ගමට සමීප වු පුද්ගලයෝ වෙමු. එහෙත් ගමේම ඇට්ටර වූ මට වඩා, ළමා වියේම කොළඹට ආ සිසිර ගැමි වදන් හා ගැමි වහර සිය නිමැවුම් සඳහා අර්ථ වත් ආකාරයෙන් යොදා ගැනීමෙහිලා සුවිශේෂ හැකියාවක් දක්වන්නෙකි.

ඔහුගේ ගීත රචනාවන් හි ආටෝපයත්, රසයත් ඉස්මතු වන්නේ එම ගැමි වහරේ සුවඳින් ය.

සිසිර සහ මම සන්නස සහ පහන යන මෙල්බර්න් ප්‍රකාශන දෙකටම ලියන්නෙමු. සිසිර ලියන එකදු වචනයක් කිසිවෙකුගේ සිතට නොරිස්සුමක්, වේදනාවක් ගෙන දෙන්නේ නැත. මා ලියන දේ නිසා සලිත වන සමහරෙක් මට ආසිරි පතන්නෝය. සෙත් ශාන්ති කරන්නෝ ය. සිසිරට ඒ ලැබීම නැත.

සිසිරගේ ශක්තිය- සහජ ගුණය - රැඳී ඇත්තේ එම නොලැබීම තුළ ය. වෙනත් වචනයෙන් කිවහොත් කිසිවකුගේ සිත නොරිදවන විදිහේ තැන්පත්, පරිණත ගුණය නිසා ය. එය සිසිර තුළ පිහිටි සහජ කුසලතාවකැයි සිතමි.

මා එය අවධාරණය කරන්නේ බොහෝ කලාකරුවන් තුළ එමඋදාර ගුණය මා නොදකින නිසා ය. සිසිර මා සමඟ කී ඔහුගේම අත්දැකීමක් මට මතක් වෙයි. සිසිරගේ ගීතයක් හෝ දෙකක් ද ඇතුළත් කොට ගීත තැටියක් නිර්මාණය කළ සිසිරගේ

"මිතුරකුගේ" කතාවකි. එහි ගුණ දොස් දක්වන්නැයි සිසිරගෙන්

"මිතුරා" ඉල්ලා සිටියේ ය. අවංක ආයාචනයක් යැයි සිතූ සිසිර තමාගේ අවංක අදහස් කියන්නට පටන් ගත්තා පමණි. අදහස් කියා හමාර වන්නටත් කලින් මිතුරා, පසමිතුරාගේ තැනට වැටිලා ය. දිගින් දිගට තමාට දොස් කියමින් ඊ - මේල් පවා එවූ බව ය මට ඔහු කීවේ.

ඒ කියන විට මම සිසිරගේ වචන වලට පමණක් නොව, ස්වරයටත් පරිස්සමින් සවන් දුනිමි. ඒ දෙකෙන්ම මා දුටුවේ නොරිස්සුමක්, අප්‍රසාදයක් නොවේ. "මිතුරා" පිළිබඳ නිර්ව්‍යාජ අනුකම්පාවකි. සංවේගයකි.

විවේචනයට ඔරොත්තු දීමට සමත් කලාකරුවෙකු වශයෙන් එදා උළෙලේදී හරවත් දෙසුමක් කළ සිසිරගේ සගයා ජගත්. ජේ. එදිරිසිංහ සිසිර හැඳින්වූයේ ආවැඩීමක් හැටියට නොව - අත්දුටු සත්‍යයක් බව - අවධාරණය කරමිනි.

මෙහිදී මට සිහිපත් වන්නේ ඔස්ට්‍රේලියාවාසී අපේ දැරියකගේ (දැන් අම්මණ්ඩි කෙනෙකුගේ) අත්දැකීමකි. ඇය අද ශ්‍රී ලංකාවේ සුපිරි සංගීතඥයකු - ගායකයකු වන - යටතේ ගායනය උගත්තා ය. සිය ගුරුවරයාගේ වාගේම - ඔහුගෙ ගායනයට ළං වන විදියටම - ගායනය කරන්නට ශිෂ්‍යාව සමත් බව බොහෝ දෙනා පිළිගත්හ. මෙසේ තිබිය දී ඇය වාසය කළ පෙදෙසේ ප්‍රසංගයක ගී ගැයීම සඳහා ඇගේ යට කී ගුරුවරයාට ඇරයුමක් ලැබුණේ ය. ඔහු ආරාධනාව පිළිගත්තේ එක් කොන්දේසියක් උඩ ය.

**සිසිරත්, මමත් ගමට සමීප වු පුද්ගලයෝ වෙමු. එහෙත් ගමේම ඇට්ටර වූ මට වඩා, ළමා වියේම කොළඹට ආ සිසිර ගැමි වදන් හා ගැමි වහර සිය නිමැවුම් සඳහා අර්ථවත් ආකාරයෙන් යොදා ගැනීමෙහිලා සුවිශේෂ හැකියාවක් දක්වන්නෙකි.**

"මගේ අර ශිෂ්‍යාවට ප්‍රසංගයේ ගී ගැයීමට නොදිය යුතු ය".

ගුත්තිල - මූසිල වාදය සදාතන ඝට්ටනයක් ය.

සුපිරි සංගීතඥයාගේ නම සඳහන් කළහොත් එය විශ්වාස නොකරනවා පමණක් නොවේ, පාඨකයා මට ශාප කරන්නට ද ඉඩ ඇත.

කලාකරුවන් ගැන මුලින් සඳහන් අකාරුණික අදහස ඉදිරිපත් කළේ එම ප්‍රවෘත්තිය නිසා ය.

මා සිසිර දිසානායක නම් වූ ගීත රචකයා, කලාකරුවා අගය කරන්නේ ඒ විදිහේ කහටක් හිතේ රඳවා නොගෙන සිය නිමවුම් කිරීමට, ලේඛන කාරියේ නිරත වන්නට ඔහු තුළ පවත්නා සුපිරි ගුණය නිසා ය.

සිසිරගේ එම සුපිරි ගුණය නොහොත් මහත්තැන්කම නොනැසී, නොපිරිහී දිගටම පවතීවා යයි ඉත සිතින් පතමි. සමාජයේ ඉදිරියෙන් යන එම කලාකරුවා එබඳු සුපිරි මිනිසෙකු වීම සමස්ත සමාජයේම ඉදිරි ගමනට හිතකර වන්නේම ය.

අවසාන වශයේ "නුඹෙ සිරික්කියට" සී.ඩී තැටිය එළි දැක්වූ උළෙල ගැන වචනයක්.

ගීතයක් ගායනා කරන විට කිසිම තේරුමක් නැතිව වේදිකාව මතට නගින නැට්ටුක්කාරියන් නුරුස්සන මම එදා ගායක ගායිකාවන් එම සම්බාධකය විරහිතව ගායනා කිරීම අගය කරමි. කොළඹ එළි දැක්වීමේදී "නුඹෙ සිරික්කියට" ගීය ඉදිරිපත් කිරීමේදී නැටූ නැටුම ගීතයට රුකුළක් වශයෙන් අර්ථ වත් රංගනයක් වේදිකාවට එන විරල අවස්ථාවක් වූ බව ද කියමි.

ඩී.බී. කුරුප්පු